## ස්වභාවික ගොවිතැන සඳහා බීජ බෝල තාක්ෂණය

**"The ultimate goal of farming is not the growing of crops, but the cultivation and prefection of human beings"**

***- Masanobu Fukuoka -***



පාරිසරික සාක්ෂරතාවය (Eco literacy) ප්‍රගුණ කරන්නට අනුව ස්වභාවය සැම මොහොතකම අපවෙත පණිවිඩයක් සපයයි. සංකේතිය නොවන මෙම සංනිවේදනය සංවේදිය අයකුට වැටහේ. එහිදී ඔහුට දැනෙන අසිමිත අතිරික්ත වින්දනය අන් අයට සංනිවේදනය කිරීමට දරන උත්සාහය නිර්මාණය උපත ලබන නිමේෂයයි. "ඉදී රත් පැහැ ගැන්වුන රඹුටන් පොකුරක් ආහාරයට ගන්න එවිට ඒ තුල ඇති බීජ නිරාවරනය වී පරම්පරාව ඉදිරියට ගෙන යැමට හැකි වනු ඇත." ඇතැම් විට එය මෙවැනි පනිවිඩයක් අපහට පවසනවා විය හැක. කපුටන් ලේනුන් වැනිසතුන් මෙවැනි පණිවුඩ අනුව යමින් එහි කොටස් ආහාරයට ගෙන බීජ ප්‍රචාරණයට උදැව්වේ. මෙහිදි ස්වභාවය දෙපාර්ශයම දිනන විසඳුම් (Win Win Solutions) සපයයි. කපුටාට අහර ලැබේ. රඹුටන් බීජ මව් ශාකයෙන් ඈතට විසිරී යයි. පළතුරු ආහාරයට ගන්නා බොහෝ පක්ෂින් සිය ජිවිත කාලය තුල එළෙඹෙන සැම පළතුරු වාරයකම බොහෝ බීජ ප්‍රමාණයකින් මව් ශාකයෙන් ඈතට විසුරුවා හරිති.

අප මිනිසුන් වශයෙන් සාමුහිකව සැම තැනකම අනසක පතුරුවා ඇතත් තනි තනි ලෙස අපගේ බල පුලුවන්කාරකම් ස්වභාවයේ සිමාවට යටත් වේ. සාමුහිකව අප ශක්තිමත් යැයි හැඟුණත් තනි තනිව අප මුහුණ දෙන අනාරක්ෂිත හැගිම ආගමික කතිකාවතකදී විමසීමට ලක් වේ. මේ ලිපිය ආගමික කතිකාවතක්, ස්වාභාවය ප්‍රතිනිර්මාණය සඳහා සාර්ථකව යොදාගන්නා පුද්ගලයෙක් හා එහිදී ඔහු යොදා ගන්නා සරල එහෙත් විස්මිත තාක්ෂණයක් ගැනයි. විද්වතුන්ට අනුව මෙහි එන ස්වාභාවික ගොවිතැනෙ තාඕ දහමෙහි හා බුදු දහමෙහි මුලධර්ම සංකලනයෙන් සම්භවය වී ඇත. තනිපුද්ගලයින් වශයෙන් ස්වභාවයේ ක්‍රියාවට ප්‍රතිචාර දැක්විය හැනි ආකාරය පිළිබඳ ගුරුහරු කමක් අපට ජපාන ජාතිකයෙක් වන මැසනොබු ෆුකුඕකා (Masanobu Fukuoka) ලැබේ. ඔහු පවසන්නේ ස්වභාවයට සම්පුර්ණයෙන්ම ඉඩ දුනහොත් සිය සම්පූර්ණ සමතුලිතතාවය තමාම සකසා ගන්නා බවයි. මේ පිළිබඳව මිනිසා කිසිවක් නොදනී. එමෙන්ම මානුෂිකත්වයට කිසිම දෙයක් දැනගත නොහැකි බවද අවධාරණය කරන ඔහු ස්වභාවයට සිය සම්පූර්ණත්වය ඇතිකර ගැනිම සඳහා ඉඩ දීමට ***නොකිරීමේ ගොවිතැන (Do nothing Farming)*** නම් ක්‍රමයක් යෝජනා කරයි. ගොවිතැනේ අවසාන පරමාර්ථය ලෙස ඔහු යෝජනා කරන්නේ බෝග වගා කිරීම නොව මනුෂ්‍ය වර්ගයාගේ සත්භාවය වගා කිරීම හා පරිපූර්නත්වයට පත් කිරීමය.

ඔහුගේ නොකිරීමේ ගොවිතැන ස්වභාවික ගොවිතැන *( Natural Farming )* නමින්ද හඳුන්වයි. එහි මූලික සංකල්ප සතරකි.



ඔහුගේ ගොවිතැන් කලාව අඩුයෙදවුම් හා ඉහල අස්වනු ලබාදෙන ක්‍රමයක් වන අතර පැල ගලවා සිටුවීම තවාන් දැමීම වැනි කටයුතු සිදු නොකරන අතර කිසිදු ආකාරයක බිම් සකස් කිරීමක් ද නොකරයි. බීජ ඍජුවම වැපිරීම පමණක් සිදුකරයි. වපුරන්නේ එක් බීජ වර්ගයක් පමණක් නොවේ. ග්‍රීස්ම ඍතුවේ වගා කරන ධාන්‍ය වර්ග හා වී සන්තතිකව බීජ ඉසිනු ලබන අතර ඒ සමගම ශාඛ වැස්මක්ද ඇතිකරනු ලබයි. බීජ වැපිරිමේදී ද ශ්‍රී ලංකාවේ වී වපුරනවා මෙන් බීජ ක්ෂේත්‍රයේ ඍජුවම වැපිරීමක් සිදු නොකරයි. ෆුකුඕකා එහිදී සිත් ගන්නා සුළු උපක්‍රමයක් ක්‍රියාවට නගයි. එය හඳුන්වන්නේ බීජ බෝල තාක්ෂණය යන නමිනි. බීජ අඩංගු කොට කුඩා මැටි බෝල සාදනු ලබයි. ඉසිමට ගනු ලබන බීජ මෙලෙස මැටි බෝල වල අඩංගු කිරීම මගින් මූලික වාසි දෙකක් සැලසෙන බව ෆුකුඕකා කියයි.





1. බීජ කේෂ්ත්‍රයෙදී මියන් හා පක්ෂීන් වැනි සතුන් විසින් අහුලා කෑමෙන් වන හානි වැළකේ.

2. ජලය ලැබුනු විටදී බීජ ප්‍රරෝහනය වේ. ජලය නොලැබෙන තාක් කල් මෙම මැටි බෝල තුල බීජ සුරක්ෂිතව පවතී. මෙලෙස සැකසූ බීජ බෝල පවනේ වියලා සවි වූ පසු ක්ෂේත්‍රයේ විසුරුවා හරියි. මෙයට සමාන්තරව වෙනත් තාක්ෂනික ක්‍රම ද යොදා ගනියි.

3. මුළු ක්ෂේත්‍රයම ආවරනය වන සේ  පිදුරු විසුරුවා හැර වැස්මක් යෙදීම.

මෙහිදී දිරා යන පිදුරු මගින් පසට පාංශු පෝෂක සැපයීමත්, ප්‍රරෝහනය පහසු වීමත් පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව ඉහල යාමක් සිදු වන අතර කුරුල්ලන්ගේ හානි අවම වීමත් වල් පැලෑටි පැලවීමේ අඩු වීමක් සිදුවේ. මෙහිදී පිදුරු හොඳින් විසුරුවා හැරීම ඉතා වැදගත්වේ. ෆුකුඕකාගේ ගොවි පලෙහි පළතුරු වගාවන්ද ඇත.  මේවා කිසිදු විට කප්පාදු කිරීමකට ලක්නොකරන අතර, කෘෂි රසායනික ද්‍රව්‍ය වැනි දෑ ඉසීමක්ද සිදුනොවේ. බෝග විශේෂ බොහෝ සංඛ්‍යාවක් එකට වගාකරනු ලබන අතර ක්ලෝවර් ඇල්ෆැල්ෆා Clover(alfalfa) වැනි පස සරු කිරීමට යොදන ශාඛ විශේෂයන්ද එකවර වගා කරනු ලබයි.

ෆුකුඕකා විශේෂිත බෝග වගා ක්‍රමයක් අනුගමනය කරනු ලබයි. ඔක්තෝබර් මාසයේදී ඔහු ග්‍රීෂ්ම ධාන්‍ය හා ක්ලෝවර් (Clover) නම් රනිල ශාකයෙහි බීජ ඒ වන විටත් ක්ෂේත්‍රයේ ස්ථාපනය  කොට ඇති වී බෝගය අතරතුර විසුරුවා හරියි. ඉන් පසුව ක්ෂේත්‍රයම පුරා පිදුරු තුනී කොට විසුරුවා හරියි. මෙයට මාස දෙකකට පසු වී බීජ බෝල විසුරුවා හරිනු ලබන අතර ඒ සමගම කුකුල් වසුරුද ක්ෂේත්‍රයේ විසුරුවා හරිනු ලැබේ. මැයි මාසයේදී පමණ ධන්‍ය අස්වනු නෙලනු ලබන අතර එහි පිදුරු ක්ෂේත්‍රය පුරා විසුරුවා හරිනු ලැබේ. පසුව ක්ෂේත්‍රයේ ජලය පුරවා සතියක් පමණ තබනු ලැබේ. මෙයට සමාන ලෙසින් ලංකා වේ ගම්බද ගොවීන්ද කුඹුරේ පිදුරු විසුරුවා ජලය බැඳීමක් පස සරු කිරීම සඳහා සිදු කරයි. ලංකාවේ නම් මේ සඳහා හුඹස් මැටි ගත හැක.

## විසුරුවා හැරිමට බීජ බෝල සකසන ආකාරය



අවශ්‍ය ද්‍රව්‍ය හා ඒවායේ අනුපාතයන් පහත දැක්වේ.

1. ජලය එක්කොටසක්
2. පාංශු හ්‍යුමස්/ලෝම පස් එක් කොටසක්
3. බීජ මිශ්‍රණයේ කොටස් තුනක්
4. සියුම්ව කුඩුකරන ලද රතු මැටි කොටස් පහක්



මේවා සියල්ල එකට ගෙන අඟල් භාගයක් පමණ වනසේ කුඩා බීජ බෝල සාදනු ලබයි. ස්වභාවික ගොවිතැන එතරම් ව්‍යාප්ත වී නොමැත්තේ ඇයිද යන ප්‍රශ්නයට ෆුකුඕකා මෙබඳු පිළිතුරක් ලබාදෙයි. ස්වභාවික ගොවිතැන පිළිගැනිමටත් එය ප්‍රායෝගිකව අත්හදා බලා ප්‍රතිපල අත් විඳීමටත් අප සිතන පොදු ක්‍රමයේ වෙනස් වීමක් අවශ්‍යවේ. මෙබඳු මනෝ විද්‍යාත්මක වෙනස් වීමක් සාමාන්‍යයෙන් සමාජයේ අත්විඳිය නොහැක.



එමෙන්ම දෙවෙනි හේතුව නම් මිනිසුන් පාලනය කිරීමෙහි වඩා කැමති වීමයි. මිනිසාද ස්වභාවය පාලනය කරමින් එහි ස්වාමියා වීමට දැඩි ප්‍රයත්නයක් දරයි. එහෙත් ස්වභාවික ගොවිතැන ස්වභාවය පාලනය කිරීමක් අපේක්ෂා නොකරයි. තුන්වන හේතුව නම් ලෝකය තද බල ලෙස වානිජකරණය වී තිබීමයි. ස්වභාවික ගොවිතැන ඉතා සරල වේ. සරල බව වෙළෙඳපොලෙහි අලෙවි කල නොහැක. එමනිසා සරල ස්වභාවික ගොවිතැනට සමාජ පිළිගැනිමක් නොමැත.

සිව් වැනි හේතුව නම් ජපානයේ මෙම ස්වභාවික ගොවිතැන් කලාව සාර්ථක වුවත්, මෙම සිද්ධාන්ත වෙනත් භූගෝලිය ප්‍රදේශයක ක්‍රියාත්මක කිරීමට නම්, ප්‍රාදේශිය පර්යේෂණකරණය අවශ්‍ය විමයි. සාමාන්‍යයෙන් ජපානයේ ස්වභාවික ගොවිතැන් සිදු කරන ආකාරයටම වෙනත් භූගෝලිය ප්‍රදේශයක එය ක්‍රියාවට නැගුවහොත් අසාර්ථක වීම් ඇති වන්නට පුළුවන.

ලිල් රන්දෙණි
පරිසර කළමනාකරණ නිලධාරී